කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2013

2016 - ඔක්තෝබර්

**BCOME 4015** - උපායමාර්ගික කළමනාකරණය.

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි ) 06 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. "උපායමාර්ගයක්" යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. එය තරඟකාරිත්ව වාසිය අත්පත් කරගැනීම සඳහා උපකාරි වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. වෙනස්වන ව්‍යාපාර පරිසරයක් තුල ව්‍යාපාර කටයුතු කිරීමේදී අවස්ථානුකූල ප්‍රවේශයන් අවශ්‍ය වේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

02. අ. ව්‍යාපාර මොඩලයක් යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. උපායමාර්ග ක්‍රියාවට නැන්වීමේදී එය උපකාර වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. උපායමාර්ගික කළමනාකරණ ක්‍රියාවලියෙහි පදනම ලෙස වර්ථමාන මෙහෙවර, අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම සඳහන් වී ඇත. මෙම ප්‍රකාශය අගයන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

03. අ. ශදුඅත විශ්ලේෂණය යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. ශදුඅත විශ්ලේෂණය අභ්‍යන්තර විශ්ලේෂණයට උපකාර වන ආකාරය පහදන්න.

(ලකුණු 08)

ආ. තරඟකරුවන්ට සාපේක්ෂව වාසි අත්පත් කර ගැනීමට සමාගමක සෑම මට්ටමකටම අදාල උපායමාර්ග තෝරාගැනීම උපායමාර්ග නිර්මාණය කිරීමේ අදියරයකි. ඔබ එකඟ වන්නේද? පහදන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

04. අ. සංස්ථානික උපායමාර්ග යනු කුමක්ද ? සංස්ථානික උපායමාර්ග වර්ග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

ආ "උපායමාර්ගික නම්‍යතාවය නූතන සංකල්පයකි". සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

05. අ. සුදුසු උදාහරණ භාවිතා කරමින් අන්තර්ජාලය වර්තමාන ව්‍යාපාර වෙනස්කර ඇති ආකාරය පහදන්න.

(ලකුණු 08)

ආ. වර්තමානයේ සමහර සමාගම් ව්‍යාපාර කාර්යයන් තුන්වන පාර්ශවයකට භාරදීමට පෙලඹේ. මෙම කියමන උපායමාර්ග අනුසාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

06. අ. සමාගමකට වෙළඳ භාණ්ඩ මිල පහත හෙලීම සාධ්‍ය උපායමාර්ගික මුල්පිරිමක් ලෙස දැකිය හැක. මෙම කියමනට ඔබ එකඟ වන්නේද ? සුදුසු උදාහරණ භාවිතාකර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. "විවිධාංගිකරණය" යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. විවිධාංගිකරණය කෙරූ භාණ්ඩ වෙළඳපොලෙහි සාර්ථක වන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)